# නොමිලේ ඊ-මේල් ලබාගන්න ඔබත් කැමති ද?

සාමාන්‍යයෙන් ඊ-මේල් ගිණුමක් ලබා ගැනීමට යම් මුදලක් මාස්පතා ගෙවිය යුතු වේ. නොඑසේනම් අන්තර්ජාල පහසුකම් ලබාගැනීමේදී එම ආයතන මගින් නොමිලේ ගිණුම් කීපයක් ලබා දේ. ඒ සඳහා ඔබට පරිගණකයක් හා අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් මුදලක් ගෙවිය යුතු වේ.

නමුත් ඔබට පරිගණකයක් හෝ අන්තර්ජාල පහසුකම් නොමැතිව වුවද නොමිලේ ඊ-මේල් ගිණුමක් ලබාගත හැකි බව ඔබ දන්නවා ද? මේ සඳහා මිතුරකුගේ, අන්තර්ජාල පහසුකම් සහිත පරිගණකයක් හෝ ගෙවීමේ ක්‍රමයට ලබා ගන්නා අන්තර්ජාල පහසුකම් Ceyber Cafeඇති ස්ථානයකට ඔබ යා යුතු වේ.

Hotmail, Yahoo, Kaputa.Com. වැනි වෙබ් අඩවි පහසුකම ලබාදෙන ජනප්‍රිය වෙබ් අඩවි කීපයකි.

අනිකුත් වෙබ් අඩවි මගින්ද මේ හා සමානව ඊ-මේල් ලිපිනයන් ලබාගත හැකි නිසා Hotmail මගින් ඊ-මේල් ලිපිනයන් ලබාගන්නා අන්දම පමණක් මෙහි සටහන් කරමු.




1 රූපය

මේ සඳහා පළමුව අන්තර්ජාලයට පිවිස, Hotmail.Com.වෙබ් අඩවියට පිවිසෙන්න මෙහි ඉහළින් ඇති Sign Upයන්න සක්‍රිය (Dobble Clck) කරන්න. එවිට සරල අයැදුම්පතක් දිස් වේ. එහි ඇති Country/Region යන්නෙහි ඇති ගලාහැලෙන මෙනුවෙන් Sri Lanka යන් තෝරාගන්න. එවිට අප රටට උචිත ලෙස සැකසූ අයැදුම්පතක් දිස් වේ.

මෙම අයැදුම්පත් ආශ්‍රයෙන් සැකසූ ආදර්ශ අයැදුම්පතක් මෙහි දක්වේ (1 රූපය) මෙහි පළමුවෙන්ම ඔබේ මුල් නම, වාසගම නිවේශනය කළ යුතු වේ.

මෙහි Occupation යටතේ ගලාහැලෙන මෙනුවෙන් ඔබේ තත්ත්වය (රැකියාව) තෝරා ගත යුතුයි. මීළඟට වැදගත් වන්නේ E-mail Address යන්නයි. මෙහිදී ඔබ කැමති නමක් සඳහන් කළ හැකි මුත් සඳහන් කරන නම ඔබේ ඊ-මේල් ලිපිනය වශයෙන් හඳුන්වන නිසා ඔබට මෙන්ම අන් අයටද පහසු නමක් යෙදිය යුතු යි.

ඊට පහළින් ඇති Password යන්නෙහි රහස් අංකය සටහන් කළ යුතුයි. මෙහිදී අකුරු, අංක, හෝ මේ දෙකම මිශ්‍රව එමෙන්ම Capital හෝ Simple ලෙසද යෙදිය හැකිය.

මෙහිදී වැදගත් වන්නේ මෙම රහස් පදය ඔබට මතක තබා ගැනීමට පහසු ලෙස සටහන් කිරීමයි. ඊට පහතින් ඇති රහස් ප්‍රශ්නය (Secret question) යටතේ ගලාහැලෙන මෙනුවෙන් ප්‍රශ්නය තෝරා ඊට පහළින් ඇති කොටුවේ උත්තරය සටහන් කරන්න. මෙහි අවසන් පියවර වන්නේ අයදුම්පතේ පහතින්ම ඇති I Agree නම් කොටස සක්‍රිය කිරීමයි.

ඔබේ අයැදුම්පත නිසි ලෙස පුරවා නැතිනම් එහි අඩුපාඩු පරිගණකය මගින් ස්වයංක්‍රියව පෙන්වාදෙයි. එවිට එම අඩුපාඩු නැවත සැකසිය හැකිය.

80 පිටුවට




3 රූපය




2 රූපය

# නොමිලේ ඊමේල්...

37 පිටුවෙන්

අප මෙහි පල කල ආදර්ශ අයදුම්පතේ සඳහන් කල Janakaනම භාවිතයේ පවතින නිසා වෙනත් නමක් නිවේශනය කළ යුතු බව දක්වෙන පණිවුඩයක් (2 රූපය) දිස්විය. මෙහිදී ඔවුන් විසින් නම් කීපයක් යෝජනා කර ඇත. කැමතිනම් මෙයින් එක් නමක් තෝරාගත හැකි ය. නැතහොත් ඊට පහතින් ඇති කොටුවේ නැවතත් අලුත් නමක් නිවේශනය කළ යුතු වේ. (මෙහිදී ඔබට කැමති ඕනෑම නමක් භාවිත කළ හැකි බව සලකන්න.)

අයැදුම්පත නිසි ලෙස සකස්වී තිබේ නම් ඔබේ ඊ-මේල් ලිපිනය හා රහස් අංකය දිස්වේ.

දැන් ඔබට ඔබේම නමින් ඊ-මේල් ගිණුමක් ඇත. පසු අවස්ථාවකදී ඔබට ලිපියක් යැවීමට හෝ ලබා ගැනීමට අවශ්‍ය නම් Hotmal.Com වෙබ් අඩවියට පිවිස Signin හි ඔබේ ඊ-මේල් නම නිවේශනය කර Password හි රහස් අංකය සටහන් කර Sign inසක්‍රිය කරවන්න. මෙහිදී ඔබේ ඊ-මේල් ගිණුම විවෘත වේ. (4 රූපය) මෙහි In box මගින් ඔබටපැමිණි ඊ-මේල් බැලීමට ද Compose මගින් ඊ-මේල් යැවීමට ද හැකි වේ.

කිසිදු අපහසුවකින් තොරව ඔබට නොමිලේම ඔබේම ඊ-මේල් ලිපිනයක් ලබාගත් අයුරු අපූරුයි නේද?

**- මොහාන් ජයසිංහ**